විමර්ශී 36

# ලෝකය නොදකින ළමයි

ඕනෑම යුද්ධයකදී, නැතිනම් වෙනත් ව්‍යසනයකදී වඩාත්ම පීඩාවට පත්වන්නේ ස්ත්‍රීන් සහ දරුවන් බවට ලෝක පිළිගැනීමක් ඇත. එය පිළිගැනීමක් පමණක් නොව අතිශයින්ම සත්‍ය බවට උදාහරණ ඕනෑතරම් ඇත. අතිශය බිහිසුණු යුද්ධයකට මුහුණ දුන් වන්නියේ ජනතාව ගොදුරු වූ අනේක විධ දුක් පීඩාවලට සමසේ මුහුණ දුන් ළමා ජනගහනයක් අවතැන් කඳවුරුගතව සිටින බවට ඉතා සුළු වශයෙන් මාධ්‍ය තුළින්ද වරින් වර දකින්නට ලැබිණ.

ලෝකයේ ළමා අයිතිවාසිකම් වෙනුවෙන් හඬක් මතු කිරීම අරමුණු කර ගත් ලෝක ළමා දිනය මෙවර ගෙවී ගියේ ශ්‍රී ලංකාවේ දරුවන්ගෙන් කොටිඨාශයකට, දරුවන්ට හිමි අයිතිවාසිකම් තබා මූලික අවශ්‍යතාවන්වත් ඉටු නොවන තත්ත්වයක් යටතේය. ඔක්තෝබර් 1දාට යෙදුණු ලෝක ළමා දිනය උදාවීමට පෙර සතියේ, එනම් සැප්තැම්බර් 21 සිට 27 දක්වා සතියක කාලය තුළ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිරීක්ෂණය කරන විට ලෝක ළමා දිනය සිහි ගන්වන යම් යම් පුවත් පළ වී තිබෙන ආකාරය නිරීක්ෂණය කිරීමට හැකි විය. ඒ අතර එක් පුවතකින් කියැවුණේ මෙවර ළමා දිනයේදී අවතැන් කඳවුරුවල දරුවන් ගැන වැඩි අවධායක් යොමු කරන බවයි. නමුත් එයින් කියැවුණේ කඳවුරුගත දරුවන්ගේ අනාගතය යහපත් කිරීමට ගන්නා පියවර ගැන හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් ඉටු කිරීමක් ගැන නොවේ. ආණ්ඩුවේ ඇමැතිවරියක් වන ළමා හා කාන්තා සංවර්ධන ඇමැතිනී සුමේධා ජී ජයසේන මූලාශ්‍ර කර ගත් එම පුවතින් අනාවරණය කර තිබුණේ සහන ගම්මානවල දරුවන් සමඟ ක්‍රීඩා හා සෞන්දර්යාත්මක වැඩ සටහන් කිහිපයක් දින තුනක් තුළ ක්‍රියාත්මක කරන බවකි. එම පුවත පළ වී තිබුණේ එක් සිංහල පුවත්පතකය (ලක්බිම). අදාල සතිය තුළ සිංහල පුවත්පත්වල දරුවන් සම්බන්ධයෙන් පළවී තිබුණේ පුවත් දෙකකි. අනෙක් පුවත පළ කළ පුවත්පත (ලංකාදීප) අවතැන් කඳවුරුවල දරුවන් සම්බන්ධ එක් ඛේදනීය තත්ත්වයක් ගැන අනාවරණය කරයි. පුවත්පතේ 7 වැනි පිටුවේ, ප්‍රමුඛතාව ගැන සැළකිල්ලක් නොදක්වා හෝ පළ කර ඇති එම පුවතින් අනාවරණය වන්නේ වව්නියාවේ අවතැන් කඳවුරුවල සිටින දරුවන්ගෙන් 1064 දෙනෙකුට නිසි භාරකරුවන් නොමැති බවයි. ළමා රක්ෂණ කොමසාරිස් සරත් අබේගුණවර්ධන මූලාශ්‍ර කර ගත් එම පුවතට අනුව, දරුවන් 393කට මව්පිය දෙදෙනාම අහිමිය. එමෙන්ම දරුවන් 194ක් ඥාතීන් විසින් භාර ගෙන ඇති බවද, 161ක් අවතැන් කඳවුරුවල පිහිටුවා ඇති ළමා නිවාසවල රඳවා ඇති බවද, කැපකරු මව්පිය ක්‍රමය යටතේ 50 දෙනෙකුගේ භාරකාරත්වය පවරා ඇති බවද සඳහන් වේ. නමුත් 1064 දෙනෙකුට නිසි භාරකාරත්වයක් නොමැති බව සඳහන් කරන්නේ කුමණ පදනම යටතේද, ඥාතීන්ට හා ළමා නිවාසවල සිටින්නේ දෙමාපියන් නැති දරුවන්ද, ඉතිරි දරුවන් සිටින්නේ කා සමඟද යනාදී පැහැදිලි කිරීමක් මේ වාර්තාවෙන් ලබා ගත නොහැක. කෙසේ වුවත් මේ තත්ත්වය ගැන සතිය තුළ සිංහල පුවත්පත්වලින් සිදුවූ වූ එකම අනාවරණය එය වන අතර මෙම පුවත දෙමළ මාධ්‍ය පුවත්පත් දෙකක (සුඩර් ඔලි, තිනක්කුරල්) පළ වී තිබිණ. එම වාර්තා දෙකට ඇතුළත් තොරතුරුද සිංහල වාර්තාවට සමාන වන අතර තොරතුරු ලැබී ඇති මූලාශ්‍රයද සමානය.

දරුවන් සම්බන්ධයෙන් තවත් පුවත් දෙකක් දෙමළ මාධ්‍ය පුවත්පතක (සුඩර් ඔලි) සහ ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පතක (ඩේලි මිරර්) පළ වී තිබුණි. ඒවා ඉදිරියේදී පැවැත්වීමට නියමිත අපොස සාමාන්‍ය පෙළ විභාගය හා සම්බන්ධය. නමුත් පුවත් දෙක එකිනෙකට වෙනස්ය. දෙමළ මාධ්‍ය පුවතින් අනාවරණය කරන්නේ යාපනයේ අවතැන් කඳවුරුවල වෙසෙන හා කඳවුරුවලින් නිදහස්ව ගිය සිසුන්ට විභාගයට ඉදිරිපත්වීම සඳහා ඉල්ලුම් පත්‍ර දැමීමට අදාල අංශවලින් කටයුතු කර නොමැති බවයි. ඉල්ලුම් පත්‍ර දැමීමේ කාලයද ඉක්ම ගොස් ඇත. එහෙයින් විභාගයට ඉදිරිපත්වීමේ අවදානමට ඔවුන් ඉලක්ක වී සිටී. ඉංග්‍රීසි පුවත්පතේ වාර්තාවෙන් අනාවරණය කරන්නේ වව්නියාවේ අවතැන් කඳවුරුවල සිසුන් 8000ක් මෙවර අපොස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින බවයි. අධ්‍යාපන අමාත්‍යවරයා මූලාශ්‍ර කර ගත් එම පුවතට අනුව එම සංඛ්‍යාව 6000කින් වැඩි වීමකි. හේතුව පසුගිය වසරේ යුද්ධය නිසා කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක දෙකේ සිසුන්ට විභාගයට ඉදිරිපත් වීමට නොහැකි වීමයි. මෙම සිසුන් සඳහා සති අන්ත අමතර පන්ති පැවැත්වීම සඳහා ගුරුවරුන් යවන බවත්, ඒ සඳහා දරුවන්ට පහසුකම්

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

සලසන බවත් අමාත්‍යවරයා පවසා ඇත. මේ කටයුතු ගැන රජයේ ප්‍රකාශ ගැන වාර්තා වුවද ඒවා එසේ සිදුවන්නේදැයි සොයා බලා ලියන්නට මාධ්‍යයටද අවසර නැති හෙයින් උනන්දු මාධ්‍යයකින් පවා තොරතුරු දැන ගැනීමට මහජනයාට හැකියාවක් නැති වීම අභාග්‍යයකි. මීට අමතරව ලෝක ළමා දිනය යෙදුණු ඔක්තෝබර් 1 වැනිදාට දින කිහිපයකට පෙර, යුද්ධයකට ගොදුරුව විපතට පත්ව සිටින දරුවන්ට අදාලව තවත් එක් පුවතක් ජාතික රූපවාහිනියේ පුවතකට ඇතුළත්ව තිබිණ. එයින් කියැවුණේ ඇමෙරිකාවේ පාසල් දෙකක දරුවන් එකතු කළ පාසල් උපකරණ තොගයක් අවතැන් දරුවන් වෙනුවෙන් බෙදා දීම සඳහා එහි ශ්‍රී ලංකාවේ තානාපතිවරයාට භාර දුන් බවයි.

මේ වන විට ලෝක ළමා දිනය ගෙවී ගොස්ය. ඊට පසු දින දරුවන්ගේ පළමු කඩඉම් විභාගය වන පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල නිකුත් වීම ගැන සියළුම මධ්‍ය වාර්තා කළේය. පහ වසර විභාගය පවත්වන විට කිලිනොච්චිය හා මුලතිව් යන දිස්ත්‍රික්ක දෙකම මුළුමනින්ම අවතැන්ව වව්නියාවේ කඳවුරුවලට සීමා වී තිබුණි. ඊට වසර ගණනාවකට පෙර සිට අවතැන් වූවෝද වව්නියාවේ කඳවුරුගතව සිටියහ. දිවි බේරා ගන්නට වාසනාව ලැබූ දරුවන්ගෙන් කී දෙනෙකුට ශිෂ්‍යත්වයට ලියන්නට හැකි වූවාදැයි හරිහැටි දන්නා කෙනෙක් නැත. අවතැන් කඳවුරුවල දරුවන්ද ලිවූ බව එම දිනවල මාධ්‍ය මඟින් අනාවරණය විය. ඒ ඉදිරිපත් වූයේ වසර ගණනාවක් සිටි අවතැන් දරුවන්ද, මැයි මාසයේ ජීවිතය බේරා ගෙන පළා ආ යුද ප්‍රාණ ඇපකරුවන්ගේ දරුවන්දැයි පැහැදිලි නැත. ඔවුන්ගෙන් කොටසකට හෝ විභාගයට ලියන්නට හැකි වූවානම් ඒ කුමණ තත්ත්වයක් යටතේදැයි මාධ්‍ය මඟින් කතා නොකළත් රට ගැන, ජනතාව ගැන සංවේදී සිත් ඇති අයට පමණක් සිතා ගත හැකිය. යුද්ධය පවතින අතරතුර පැවැති උසස් පෙළ විභාගයේදීද විභාග ශාලාවලම නැවතී දරුවන් විභාගයට ලිවූ ආකාරය අපට අසන්නට ලැබිණ. එකල එහි සිටි නිලධාරීන්ට අනුව වෙඩි පතිත වන විභාග ශාලා දවසින් දවසට මාරු කරමින් ළමයින්ට විභාගයට ලියන්නට සිදු විය. මාධ්‍ය හරහා ලෝකයට පෙන්වන ලෝක ළමා දින සැමරුමේ ලෝකයට නොපෙන්වන ඛේදවාචකය එයයි. එය එයින් නතර වන්නේ නැත. දරුවන් දිගු කලක් අවතැන් ජීවිත ගත කරන විට ඔවුන්ගේ අධ්‍යාපනයද ඔවුන්ගෙන් විතැන් වේ. නිසි කලට විභාගවලට ඉදිරිපත් වන්නට නොහැකි වීමෙන් අනෙක් සමාජය සමඟ ඔවුනට පසු පසින් සිටින්නට සිදු වේ. රැකියා අවස්ථා හා වෙනත් අවස්ථාවන් ලබා ගැනීමේදී මෙතෙක් පැවැති දෙමළකම නුසුදුසුකමක් වීමට අමතර නුසුදුසුකමක්ද එකතුවේ. මේ සමාජයේ දරුවන්ගෙන් කොටසකට මුහුණ දෙන්නට සිදුවන එම අවාසනාවන්ත තත්ත්වය ගැන මේ සමාජයට පෙනෙන්නේ නැත. සමාජයට පෙනෙන්නට පෙර එය මේ රටේ මාධ්‍යය දැකිය යුතුය. බොහෝ දුරට සමාජය දේවල් දකින්නේ මාධ්‍ය ඇසිනි. ජනමාධ්‍යයටද සමාජයේ එක් පැතිකඩක් නොපෙනෙන ඇස් ඇති විට සමාජයට යන්තම්වත් එය දකින්නට විකල්ප මාධ්‍යයක් තිබිය යුතුය. දරුවන්ට පමණක් නොව සමාජයට යහපතක් වන්නටනම් වර්තමාන සිදුවීම් හරහා අනාගත අනතුර හෝ යහපත හෝ දකින්නට උපක්‍රම සෙවිය හැකි මාධ්‍ය මෙන්ම දැනුවත් පුරවැසියන්ද අවශ්‍යය. ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් අඩපණ වෙමින් මර්දනය ශක්තිමත් වන රටකට එය විශේෂයෙන් අවශ්‍යය.

**සීතා රංජනී**
**seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com